# ඔටිසම්: මවුපිය වගකීම

(මෙම ලිපියේ මුල් කොටස පසුගිය සතියේ පළ විය.)

**ඔටිසම් තත්ත්වය ඇති තමන්ගේ දරුවාට ඔටිසම් යැයි බොහෝ මවුපියන් පිළිගැනීමටවත් සූදානම් නැත. කුඩා දරුවන්ගේ මවුපියන් සහ ඔටිසම් තත්ත්වය සහිතව වර්ධනය වූ යොවුන් දරුවන්ගේ මවුපියන් ලෙස ඔවුන්ව කාණ්ඩ දෙකකට වර්ග කළ හැකිය.**



කැලණිය විශ්වවිද්‍යාලයේ රාගම වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශයේ මහාචාර්ය, ළමා රෝග විශේෂඥ වෛද්‍ය

**සමන්මාලී සුමනසේන**

කුඩා දරුවකුට ඔටිසම් යැයි හඳුනා ගැනීමට නම් දරුවා ඉපදුණු වෙලාවේ සිට ඔහුගේ වර්ධන රටාවන් ගැන අදහසක් ගත යුතුය. මීට සුදුසුම ක්‍රමය ළමා සංවර්ධනය අත්පොතේ ළමා සංවර්ධන පියවර ඇතුළත් වේ. ඉන් යම් අදහසක් ගත හැකියි. දරුවා සිනා වෙන්නේ කොයි කාලෙද, සිනා වීම ප්‍රමාද බව හැඟේ නම් දරුවා පෙන්වා උපදෙස් ගත හැකි මට්ටම තෙක් මනා වැටහීමකින් මවුපියන් කටයුතු කළ යුතුවේ.

තත්ත්වය හඳුනාගෙන සැලකිලිමත් නොවී සිටීමද සුදුසු නොවේ. වහාම සායනයකට දරුවා සමඟ යොමු විය යුතුය. ස්නායු සංවර්ධනය සම්බන්ධව හට ගන්නා සංකීර්ණ ක්‍රියාවලියක ප්‍රශ්නයක් නිසා ඔටිසම් තත්ත්වයට ගොදුරු වේ. මේ තත්ත්වයට ගොදුරු වන්නේ අප ඉපදෙන විටමයි. අපේ ජානවල හට ගැනෙන යම් ප්‍රශ්නයක් නිසා ඔටිසම් තත්ත්වය හට ගන්නා බව දැනට අනුමානයයි. එහෙත් ඊට බලපාන පාරිසරික තත්ත්වද ඇත.

ලිපියේ ඉහතින් සඳහන් කළ පරිදි දරුවාට කතා කිරීමටවත් ඉඩක් නොතබා අවශ්‍යතා සියල්ලක්ම මවුපියන් විසින් පිරිමැසීම තුළ දරුවාගේ වර්ධනයට අවශ්‍ය මූලික අඩිතාලමවත් නොවැටේ. මාස 06දී දරුවා හිනා වීම සිදු නොකළොත් අඩුම තරමින් මාස 08දී වත් වෛද්‍යවරයකු වෙත යොමු කළහොත් එය දරුවාට මෙන්ම ඔබටත් වඩා පහසුවකි.

ඔටිසම් සඳහා ප්‍රතිකාර ක්‍රම වශයෙන් බෙහෙත් තොගයක් මෙන්ම රුධිර පරීක්ෂා, මොළය පරීක්ෂා ආදී පරීක්ෂණ ගණනාවක්ම ඇති බවට බොහෝ දෙනා අනුමාන කරති. එහෙත් ඒ කිසිදු අනුමානයක් නිවැරැදි නොවේ. ඔටිසම් දරුවකු පුහුණුවක් ලද විශේෂඥ වෛද්‍යවරයකුට යොමු කළහොත් එබඳු දරුවකු හැසිරෙන අයුරු, මවුපියන් මෙවන් දරුවකු හා සෙල්ලම් කරන ආකාරය පැහැදිලිව කියාදේ. කෙටියෙන්ම කිවහොත් ඔටිසම් දරුවන්ට සමාජශීලී වීමට නොහැකි කම, නොදන්නා භාවය නිසා ඊට අවස්ථාවක් සලසා දීම මවුපියන්ගේ වගකීමයි. එයද නිසි මඟපෙන්වීමක් මෙන්ම අවබෝධයක් යටතේදී පමණි. ඔටිසම් දරුවකු හුදෙකලාව සෙල්ලම් කරමින් සිටිනවා නම් ඊට හවුල් වී සෙල්ලම් කිරීමට මවට හැකිය. මෙවැනි දරුවකු සෙල්ලම් කරන විට මුලින්ම විද්වත් මණ්ඩලයක් විසින් එකී දරුවා නිරීක්ෂණය කෙරේ. ඔවුන් විසින් දරුවාට කථනය සිදු කරන අයුරුද පහදා දේ. ඒත් කිසිම වෙලාවක ඔටිසම් දරුවන්ට කතා කිරීමට උගන්වන්නේ නැත. මේ දරුවන් ගිරවු නොවේ. ඔටිසම් දරුවකුට කථනය පහසු වීමට නම් ඔවුන්ගේ මොළයේ ඇති ස්විච්ය ක්‍රියාත්මක විය යුතු අතර ඒ දෙසට යම් තල්ලුවක් ලබා දීම පමණක් අප වෙතින් ඉටු වේ. ඒ හැරුණු කොට කිසිම විටෙක බලෙන් ස්විච්ය ක්‍රියාත්මක කිරීමක් සිදු නොවේ. මේ සේවා නිවැරැදිව සේම විධිමත්ව ලබා ගැනීමත් අවශ්‍ය කෙරේ. සේවා සැපයීම් ලබාදෙන තැන් කොතෙකුත් තිබුණද වැරැදි ආකාරයෙන් උපදෙස් ලබා දීම් ගැන නිරන්තර වාර්තා වේ. එබැවින් මූලිකවම ඔටිසම් තත්ත්වය කල්තියා හඳුනා ගැනීම, නිසි සේවා වෙත යොමු වීම සේම වෛද්‍ය උපදෙස් නිසියාකාරයෙන් පිළිපැදීම මවුපියන්ගේ භාරකරුවන්ගේ යුතුකමයි.

## සමාජ බලපෑම්

ඔටිසම් තත්ත්වයට ගොදුරු වූ දරුවකු සමාජයට යොමු වීමේදී සමාජයේ පැතිකඩ විවරණය කිරීමද කොටස් 02ක් යටතේ කතා කළ හැකියි. ඉන් පළමුවැන්න මෙවන් දරුවකු සමාජගතවීමේදී මවුපියන්ට සහ නිවැසියන්ට සමාජය විසින් කෙතරම් සහාය දක්වනවාද යන්නයි. මොවුන්ගේ ඇති වෙනස් හැසිරීම් රටා නිසා සමාජය විසින් ප්‍රතික්ෂේප කිරීමක් සිදු කරනු ලැබේ. සාමාන්‍යයෙන් ඔටිසම් දරුවන් සමාජයේ සෙසු දරුවන් හා සම්බන්ධ වීමත් ඉතා අඩුය.

කුඩා දරුවකුගේ සමාජය ගත් විට පළමුවෙන්ම හමු වන්නේ පෙර පාසලයි. සමහර විටෙක පෙර පාසල් ගුරුතුමියගෙන් වුවද ඔටිසම් දරුවන් ප්‍රතිෂේප වීමට පුළුවන. ඒ අනෙක් ළමයින් මෙන් සාමූහික ක්‍රියාකරකම්වලට සහභාගී නොවී හුදෙකලාව පැත්තකට වී සිටින නිසා විය හැකිය. ඒත් අපි මෙහිදී මතක තබා ගත යුත්තේ ඔටිසම් දරුවන්ට සන්නිවේදනය කළ නොහැකි බැවින් නිසියාකාරයෙන් අදහස් ප්‍රකාශ කළ නොහැකි බවයි. මොවුන්ට අධි සංවේදන මෙන්ම ඌන සංවේදන යනුවෙන්ද ලක්ෂණ දෙවර්ගයකි. අනෙක් කුඩා ළමයින් සින්දු කියද්දී ඔටිසම් දරුවන්ගේ මොළය ඒ ශබ්දවලට හැඩ ගැසීමට අනුවර්තනය වී නොතිබීම නිසා ඔවුන් ඉන් බියවීමට හැකිය. ඒ අනුව කෑ ගැසීම, බිම පෙරළීම වැනි පුරුදු ඔවුන්ගේ අකැමැත්ත ප්‍රකාශ කිරීමේ මාධ්‍ය බවට පත් වේ.

ඔටිසම් දරුවන් සැබැවින්ම විවිධ හැකියාවලින් සන්නද්ධ වූ පිරිසකි. ලේඛන හැකියාවලින් සේම ගායන හැකියාවෙන්ද දක්ෂතා දක්වන මෙබඳු දරුවන්ට ඉදිරියට වීමට ඇති අවස්ථා අහුරා දැමීම කෙතරම් අභාග්‍යයක්ද? ඔටිසම් දරුවකුගේ මොළය නිසියාකාරයෙන් සංවර්ධනය වීමට නම් එදිනෙදා ජීවිතයේදී ඒ වෙනස විය යුතුයි. මවුපියන් නිසිකලට නිවැරැදි වෛද්‍ය උපදෙස් සේම නිවැරැදි සේවා ලබා ගැනීමත් අත්‍යවශ්‍යවේ.

(විශේෂ ස්තුතිය CDB ආයතනයට)

සටහන - මාධවී ධර්මරත්න